# වෙනස්වීම වෙනස්කිරීම

මනස මනස විසින් නිර්මාණය කෙරෙන්නේ කෙසේ ද? අප දැන් සාකච්ඡාකිරීමට සූදානම්වන්නේ මනස විසින් මනස නිර්මාණය කෙරෙන්නේ කෙසේ ද යන්න ගැන මනස විසින් ම නිර්මාණයකරන ලද ආකෘතියකි. වෙනත් ආකාරයකින් කිවහොත් මනස ගැන ප්‍රවාද, ආකෘති නිර්මාණය කරන්නේ ද මනස ම ය. අපට අවශ්‍යවන්නේ සංගත ආකෘතියක් ගොඩනගාගැනීම ය. මනස පිළිබඳ ව අප ගොඩනගන ආකෘතිය චක්‍රීය චින්තනය මත පදනම්විය යුතු ය. මනස පිළිබඳ ආකෘති ගොඩනගන්නේ ද මනස නම් එවැනි ආකෘතියක් ඒකරේඛීය චින්තනයක් මත පදනම්විය නොහැකි ය.

චිත්ත පිළිබඳ ව අපි කලින් සඳහන්කෙළෙමු. චිත්තයක් ඇති වී පැවතී නැතිවන්නේ යැයි අපි කීවෙමු. චිත්තයක් පවත්නා කාලය චිත්තක්ෂණයක් යැයි ද කීවෙමු. මෙහි දී කිවයුත්තක් වෙයි. චිත්තක්ෂණයක් හෝ චිත්තයක පැවැත්ම ආත්මවාදී වෙයි. චිත්තයක් චිත්තක්ෂණයක් හෝ පවතින්නේ යැයි ගත් පමණින් ම චිත්තයක පැවැත්මක් ගැන කියැවෙයි. එසේ චිත්තක්ෂණයක් හෝ පවතින්නේ යැයි ගැනීමේ ම වරදක් ඇත. ථෙරවාදයෙහි එසේ චිත්තක්ෂණයක පවතින චිත්තයක් ගැන කියවුණ ද සෞත්‍රාන්තිකයෝ චිත්තයක් චිත්තක්ෂණයක් පවතින්නේ යැයි නොගනිති. ඔවුන්ට අනුව චිත්තයක් ඇති වූ සැණින් නැතිවෙයි. එවිට චිත්තයකට පැවැත්මක් නැත. එහෙත් එවැනි ආකෘතියකින් චිත්තයක් හේතුකොටගෙන යම් ක්‍රියාවක් කරන්නේ හෝ කෙරෙන්නේ හෝ කෙසේද යන්න පැහැදිලි නොකෙරෙයි.

අපට චිත්තයක පැවැත්ම පිළිබඳ ප්‍රශ්නය පැනනගින්නේ ම මනසෙහි ස්වභාවය හේතුකොටගෙන ය. මනසෙහි ස්වභාවය යනුවෙන් යෙදීම ද ආත්මවාදී යැයි යමකුට කිවහැකි ය. ස්වභාවයක් ඇත්තේ පවත්නා දෙයකට ය. මෙහි දී කිවයුත්තේ ස්වභාවය වැනි දාර්ශනික වැදගත්කමක් ඇති වචන අප යොදාගන්නේ නිරපේක්ෂ අර්ථයකින් නොව සාපේක්ෂ අර්ථයකින් බව ය. මනසෙහි ස්වභාවය අනුව ම මනසට ගතහැකි කුඩා ම කාල පරිච්ඡේදයක් වේ යැයි අපි කීවෙමු. (චිත්ත හා චිත්තක්ෂණ ලිපිය බලන්න) ඒ කාල පරිච්ඡේදයට චිත්තක්ෂණයක් යැයි ද කීවෙමු. චිත්තක්ෂණයට වඩා කුඩා කාල පරිච්ඡේදයක් ගැන අපට දැනගැනීමට නොහැකි යැයි සිතමු. මේ චිත්තක්ෂණයක පවතින ලෙස ගැනෙන්නේ එක් චිත්තයකි.

මෙය තවත් පැහැදිලි කළයුතු වෙයි. චිත්තයක් යනුවෙන් යමක් නිරපේක්ෂ වශයෙන් පවතින්නේ යැයි මෙයින් ගම්‍ය නො වෙයි. චිත්තයක් නොව කිසිවක් එසේ නිරපේක්ෂ ව ඉතා කුඩා මොහොතක් හෝ පවතින්නේ යැයි ගැනීම ආත්මවාදී වෙයි. එහි නිත්‍යභාවයක් ද වෙයි. එසේ වන්නේ ඉතා කුඩා මොහොතක හෝ එවැන්නක් නිත්‍ය ව පවතින්නේ යැයි ගැනීම හේතුකොටගෙන ය. අනිත්‍ය අනාත්ම පිළිගන්නා සිංහල ථෙරවාදී බෞද්ධයකුට එලෙස ඉතා කුඩා මොහොතක චිත්තයක් හෝ වෙනත් යමක් නිරපේක්ෂ ව පවතින්නේ යැයි ගැනීමට නො හැකි ය. අනිත්‍ය අනාත්ම යනුවෙන් කියැවෙන්නේ කිසිවක් යැයි කිවහැකි දෙයක් නැතැයි ගැනීම ය. එහෙත් ඒ බව බුද්ධියෙන් අවබෝධකරගත් පමණින් නිවන් අවබෝධවන්නේ යැයි නොසිතිය යුතු ය. බුද්ධියෙන් අවබෝධකරගැනීම යනු මනසින් අවබෝධකරගැනීම ය.

අපට සියල්ල අවබෝධකරගැනීමට සිදු වී ඇත්තේ මනසින් ය. එනම් මනසට සාපේක්ෂව ය. චිත්තය ද අප අවබෝධකරගන්නේ මනසට සාපේක්ෂව ය. මනස පිළිබඳ ආකෘතියක් අප ගොඩනගන්නේ මනසට සාපේක්ෂව ය. ආකෘතිය යන්නෙන් මනසක් පවතින බවක් හා අප එහි ආකෘතියක් පමණක් ගොඩනගන බවක් නොකියැවෙයි. මෙහි දී ආකෘතිය යන්න යොදාගැනෙන්නේ එවැන්නක් නැත, එහෙත් අප එවැන්නක් ගොඩනගාගන්නේ ය යන තේරුමෙන් ය. මනසෙහි ආකෘතිය යනු මනසට සාපේක්ෂ ව නැති මනස ගන්නා ආකාරය වෙයි. පුටුවෙහි ආකෘතිය යනු නැති පුටුවක් මනස විසින් ඇතැයි ගැනෙන ආකාරය වෙයි.

මනසට ගතහැකි කුඩා ම කාල පරිච්ඡේදය චිත්තක්ෂණය යැයි කියැවෙන විට කාලය ගැන ද යමක් කියැවී අවසාන ය. අපට කාලය ගැන කතාකිරීමට සිදුවන්නේ වෙනස ආශ්‍රයෙනි. වෙනස්වීම, මතකය ආදිය කාලය යන සංකල්පය නිර්මාණය කරගැනීමේ දී වැදගත් වෙයි. එහෙත් වෙනස්වීමක් ගැන අප දැනගන්නේ වෙනස් නොවීම යන්න ආශ්‍රයෙන් ය. වෙනස් නොවීම යන්නෙන් පැවතීමක් අදහස් කෙරෙයි. යමක් පවතින්නේ යැයි ගැනීමට අපට සිදු වී ඇත්තේ

© Prof. Nalin De Silva

මනසට යමක් පවතින්නේ යැයි ගැනීමට සිදු වී ඇති බැවින් ය. එසේ යමක් පවතින්නේ යැයි ගැනීමට සිදු වී ඇත්තේ එය වෙනස්වන බව අපට දැනගත නොහැකි බැවින් ය. පුටුවක් යම් කාලයක වෙනස් නොවී පවතින්නේ යැයි මනසට හැඟෙයි. මෙය තරමක විශාල කාල පරිච්ඡේදයකි. එහෙත් චිත්තයක් යනුවෙන් යමක් එවැනි දීර්ඝ කාල පරිච්ඡේදයක නොවෙනස් ව පවතින්නේ යැයි මනස නොසලකයි. එසේ වුවත් මනසට අනුව චිත්තයකට ද පැවැත්මක් ඇත. එසේ පැවැත්මක් නැත්නම්, එනම් මනසට සාපේක්ෂව පැවැත්මක් නැත්නම්, මනසට චිත්තයක් යනුවෙන් යමක් හඳුනාගැනීමට නො හැකිවෙයි. එහෙත් චිත්තයට පැවැත්මක් ඇත්තේ ඉතා කෙටි කාලයක ය. දැන් කාලය පිළිබඳ සංකල්පය අපට හොරාම අපේ විශ්ලේෂණයට ඇතුල් වී ඇත. මෙයට කරන්නට දෙයක් නැත. චක්‍රීය චින්තනයෙහි මෙවැනි අවස්ථා උද්ගතවන බව තේරුම් ගැනෙයි. එහෙත් ඒක රේඛීය චින්තනයෙහි එවැනි අවස්ථා වුවමනාවෙන් ම මගහැරීමට උත්සාහ කෙරෙයි. ඒ උත්සාහය කෙළවරවන්නේ දෙවියන් වහන්සේ වැනි මූල හේතු සැපයීමෙන් ය.

කලින් ද සඳහන්කර ඇති ආකාරයට ථෙරවාදී බුදු දහමෙහි චිත්ත, චිත්තක්ෂණ, රූප හා නිවන යනුවෙන් පරමාර්ථ ධර්ම සතරක් වෙයි. මේ පරමාර්ථ ධර්ම මෙසේ සඳහන්කර ඇත්තේ ථෙරවාද අභිධර්මයෙහි බව අමතක නොකළ යුතු ය. අභිධර්මය යනු බුදුන් වහන්සේගේ සූත්‍ර දේශනා කැටිකර බුදුදහම ප්‍රවාදාත්මක දැනුමක් ලෙස ඉදිරිපත්කිරීමට ගත් උත්සාහයක ප්‍රතිඵලයක් වෙයි. ථෙරවාද අභිධර්මය යනු එවැනි එක් අභිධර්මයකි. එහි සඳහන් පරමාර්ථ ධර්ම මනසට සාපේක්ෂ වේය යන අදහසක් කලින් ද සඳහන්කර ඇති පරිදි බෝධි හිමියන් විසින් ඉදිරිපත්කෙරී ඇත. අපට කිවහැක්කේ මේ පරමාර්ථ යැයි කියන ධර්මවලින් චිත්ත, චෛතසික හා රූප යන ධර්ම තුන මනසට සාපේක්ෂ ධර්ම තුනක් බවත් ඒ ධර්ම තුන මනසට ගතහැකි කුඩාම ධර්ම බවත් ය. මනස පිළිබඳ ව මනසට ගතහැකි කුඩාම ධර්මය චිත්තය වන අතර චෛතසික ඒ හා බැඳී ඇත. චිත්තය පිළිබඳ සංකල්පය මනසට අනෙක් ඉන්ද්‍රියන්ගේ ආධාරය නොමැතිව ඇතිකරගත හැකි ය. රූපය යනු මනසට අනෙක් ඉන්ද්‍රියන්ගේ ද ආධාරය ඇතිව ගතහැකි කුඩා ම ධර්මය වෙයි. මේ ධර්ම පරමාර්ථ වන්නේ මනසින් තොරව පවත්නා යන අර්ථයකින් නොව මනසට ගතහැකි කුඩා ම ධර්ම යන අර්ථයෙන් ය. නිවන යනු මනසට ගතහැකි ධර්මයක් නො වේය යන්න අපේ මතය වෙයි.

චිත්ත යනුවෙන් පරමාර්ථ වශයෙන් කිසිවක් නොමැත. එහෙත් මනසට සාපේක්ෂව ගත්කල මනසෙහි කෙළවරක් නැති සිතිවිලි උපදියි. මේ සිතිවිලි අනිත්‍ය වෙයි. අප සිතිවිලි යැයි කීව ද එසේ සිතිවිලි යැයි කියන්නේ අපට අනිත්‍ය දුක්ඛ අනාත්ම අවබෝධ නොවන බැවින් ය. අනිත්‍ය මනසින් තේරුම් ගැනීමට යෑමේ ප්‍රතිඵලය වන්නේ ධර්ම නිර්මාණය කිරීම ය. චිත්තය යන ධර්මය, මනස විසින් නිර්මාණය කෙරෙන්නේ ඒ ආකාරයට ය. එසේ නිර්මාණය කෙරුණු චිත්තය ද වෙනස් වෙයි. අපි එවැනි චිත්තයක් A යනුවෙන් හඳුන්වමු. මෙලෙස ගැණුනු A නම් චිත්තය වෙනස් වන්නේ ද? අප මතක තබාගත යුතු කරුණ නම් A නම් චිත්තය ඇති වී පවතින්නේ ඉතා කුඩා කාල පරිච්ඡේදයක බව ය. A චිත්තය වෙනස්වන්නේ නම් ඒ වෙනස ගැන අපට කිවහැක්කේ කුමක් ද?

පුටුවක් වෙනස්වන්නේ යැයි කී විට එහි නොවෙනස්වන යමක්, ආත්මයක්, අවස්ථායීභාවයක් (substantive state) තිබේ යැයි උපකල්පනය කෙරෙන බව කලින් සඳහන්කෙරී ඇත. වෙනස්වීම පිළිබඳ ආත්මීය සංකල්පය එය වෙයි. එහෙත් වෙනස්වීම පිළිබඳ ආත්මීය නොවන සංකල්පයක් ද වෙයි. මහාචාර්ය වයි කරුණාදාස මහතා දක්වා ඇති ආකාරයට ඒ සංකල්පය නිර්මාණය කෙරුණේ අනුරාධපුර යුගයේ වැඩවිසූ මහාවිහාරික භික්ෂූන් වහන්සේ විසිනි. උන්වහන්සේට අනුව වස්තු ඇති වී නැති වෙයි. මේ ඇති වී නැතිවන්නේ එකම වස්තුව නො වෙයි. එහෙත් එවැනි එක් වස්තුවක් නැති විට අපි එක් වස්තුවක් වෙනස්වන්නේ යැයි ගනිමු. මේ සංකල්පයෙහි දුර්වලකම් නොමැතිවා නො වෙයි. එහෙත් අපේ රටේ එක් යුගයක වැඩවිසූ භික්ෂූන් වහන්සේ ලෝකයේ පළමු වරට වෙනස්වීම පිළිබඳ එතෙක් පැවති ආත්මීය සංකල්පය වෙනස්කිරීමට උත්සාහ දැරූහ. අප විසින් කෙරී ඇත්තේ මේ සංකල්පය තවත් වර්ධනයකිරීම ය. එහෙත් එයින් කියැවෙන්නේ දැන් එය සර්ව සම්පූර්ණ ය යන්න නො වෙයි. එහි ද අඩුපාඩුකම් ඇති බව පැහැදිලි ය.

අපි දැන් A නම් වස්තුවක් ගනිමු. A නම් වස්තුව වෙනස්වන්නේය යන්නෙහි තේරුම නම් එලෙස වෙනස්වීමක් ලෙස ගැනෙන X Y Z ආදී වශයෙන් ඇති වී නැතිවන වස්තු පරම්පරාවක් ඇතැයි යන්න ය. දැන් මේ එක් එක් වස්තුවක් ද P Q R නම් ඇති වී නැතිවන වෙනත් වස්තු පරම්පරාවකි. මෙලෙස එක් වස්තුවක් තවත් වස්තු පරම්පරාවකට යනුවෙන් කෙළවරක් නොමැති ව කැඩිය හැකි වෙයි. අභිධර්මයෙහි කෙරෙන්නේ එක් අතකින් ගත්කල මෙහි කෙළවරක්

© Prof. Nalin De Silva

ඇතැයි ගැනීම යැයි සැලකිය හැකි ය. (අභිධර්මයෙහි කෙරෙන්නේ එය නො වෙයි. අභිධර්මය සම්පාදනය කෙරී ඇත්තේ මහාවිහාරික භික්ෂූන් වහන්සේ වෙනස පිළිබඳ අර්ථකථනය නැත්නම් නිර්වචනය වෙනස්කිරීමට පෙර ය. එහෙත් මෙහි දී විස්තරකිරීමේ පහසුව සඳහා අපි එසේ සලකමු.) ඒ කෙළවර ඇත්තේ අභිධර්මයෙහි පරමාර්ථ ධර්ම යනුවෙන් හැඳින්වෙන ධර්ම වෙයි. මනසට මේ ධර්ම තවදුරටත් කැඩිය නොහැකි වෙයි. එහෙත් ඒ ධර්ම ද වෙනස් වෙයි. උදාහරණයක් ලෙස ගතහොත් නැතිවන්නේ, එසේත් නැත්නම් භංගවන්නේ ඇති වූ, එනම් උත්පාදිත චිත්තය නො වෙයි. එහෙත් ඒ උත්පාදිත චිත්තය හා භංග වූ චිත්තය, චිත්ත දෙකක් ලෙස ගැනීමට, එසේත් නැතහොත් එයටත් වඩා කාර්යක්‍ෂම ව චිත්ත රාශියක් ලෙස ගැනීමට මනසට නො හැකි ය. එනම් මනසට එතරම් සියුම්බවක් නැත. මනසෙහි ගොරහැඩිකම නිසා ම මනසට මේ අවස්ථාවෙහි දී වෙනස්වන චිත්තයක් චිත්ත රාශියක් ලෙස නොව එක් චිත්තයක් ලෙස ගැනීමට සිදුවෙයි. මෙලෙස ගතහැකි කුඩා ම චිත්තය පවත්නා කාලය චිත්තක්‍ෂණය වෙයි. එහෙත් ඒ චිත්තය ද පවත්නා කාලයෙහි වෙනස්වන බව අමතක නොකළ යුතු ය.

මහාවිහාරික භික්ෂූන් වහන්සේ වෙනස්වීම සම්බන්ධයෙන් තොකී දෙයක් මෙහි දී සඳහන්කළ යුතු වෙයි. ඇති වී නැතිවන ඇතැම් වස්තු පරම්පරාවක් අප එකම වස්තුවක් ලෙස දකින්නේ ඇයි? මෙයට හේතුව අවිද්‍යාව යැයි කී හැකි වුවත් එය ප්‍රමාණවත් නො වෙයි. අප එකම වස්තුවක් වෙනස්වන්නේ යැයි පවසන්නේ යම් වස්තු පරම්පරාවක් සම්බන්ධයෙන් පමණකි. ඇති වී නැතිවන වස්තු රාශියක් ඇතිමුත් ඉන් ඇතැම් පරම්පරා, එනම් අනුක්‍රම (sequence) පමණක් අපි එකම වස්තුවක වෙනස්වීමක් ලෙස සළකමු. එක් අනුක්‍රමයක් තවත් අනුක්‍රමයක් සමග පටලවාගැනීමක් අප අතින් නො සිදුවෙයි. අප පුටුව ලෙස ගන්නා ඇතිවී නැතිවන වස්තු අනුක්‍රමය, අප මේසය ලෙස ගන්නා වස්තු අනුක්‍රමය සමග නො පැටලවෙයි. එක් අනුක්‍රමයක වස්තුවක් අනෙක් වස්තු අනුක්‍රමය අතරට රිංගීමක් නො සිදුවෙයි. එය පැහැදිලිකරන්නේ කෙසේ ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva